ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

ලංසු සඳහා ආරාධනයයි

01. "**ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව**" වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) සභාපති විසින් පහත සඳහන් කාර්යයන් සඳහා ජාතික තරගකාරී ලංසු කැඳවීමේ ප්‍රසම්පාදන ක්‍රමය යටතේ යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුදු, තැබූ ලංසු කැඳවනු ලැබේ.

02. **ලංසුකරු පහත සඳහන් යෝග්‍යතා නිර්ණායක සමග අනුකූල විය යුතුය.**

- ලංසු ඉදිරිපත් කරනු ලබන අවස්ථාවේදී සහ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරනු ලබන් අවස්ථාවේදී ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතුය.
- ලංසු ඉදිරිපත් කරනු ලබන අවස්ථාවේදී සාගර සමුද්‍රීය ඉදිකිරීම් හෝ මහා මාර්ග ඉදිකිරීම් ක්ෂේත්‍රය යටතේ C6, C5 හා C4 ශ්‍රේණිය සඳහා CIDA ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

කොන්ත්‍රාත් අංකය	ප්‍රසම්පාදනයෙහි නම	කාර්ය විෂය පථය	ඉංජිනේරු ඇස්තමේන්තුව	සුදුසුකම් නිර්ණායක	ඉදිකිරීම් කාලය	බැංකු ඇපකරය සහ වලංගු කාලය	පූර්ව ලංසු රැස්වීම
CFHC/PD/ QWBRR/PRN/ 2026-106	පුරාණවැල්ල ධීවර වරායෙහි වරාය වේදිකා බැම්ම (quay wall) නවීකරණය කිරීම, දියකඩනය මතුපිට මාර්ගය සහ අභ්‍යන්තර මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම	වරාය වේදිකා බැම්ම (quay wall) නවීකරණය කිරීම, දියකඩනය මතුපිට මාර්ගයෙහි සහ අභ්‍යන්තර මාර්ගයන් හි හානි වූ ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම මෙම කාර්යයට අයත් වේ.	VAT බදු සහ අනපේක්ෂිත වියදම් රහිතව ආසන්න වශයෙන් ඉංජිනේරු ඇස්තමේන්තුව රුපියල් මිලියන 29.4 කි.	පසුගිය වසර පහ තුළ (2019, 2020, 2023, 2024, 2025) ඉටුකරන ලද ඉදිකිරීම් වැඩවල සාමාන්‍ය වාර්ෂික ධාරිතාව අවම වශයෙන් රුපියල් මිලියන 29.4 ක් විය යුතුය. පසුගිය වසර 10 තුළ, මෙම කාර්යයට සමාන ස්වභාවයෙන් සහ සංකීර්ණත්වයෙන් යුත් ඉදිකිරීම් කොන්ත්‍රාත් අවම වශයෙන් එකක් ප්‍රධාන කොන්ත්‍රාත්කරු ලෙස ඉදිකිරීමේ පළපුරුද්ද (මේ සඳහා ඉදිරිපත් කරනු ලබන වැඩ කොන්ත්‍රාත්තුව අවම වශයෙන් 70% ක් සම්පූර්ණ කොට තිබිය යුතුය) රුපියල් මිලියන 20.6 අතිකුත් ඉදිකිරීම් කොන්ත්‍රාත් වගකීම් වලින් තොරව හා ව්‍යාපෘතිය සම්පූර්ණ වන දින තෙක් මෙම කොන්ත්‍රාත්තුව යටතේ ගෙවීමට සිදුවන ඕනෑම අත්තිකාරම් මුදලක් හැර තිබිය යුතු අවම ද්‍රවශීල වත්කම් සහ / හෝ ණය පහසුකම රු.මි. 29.4 ට නොඅඩු විය යුතුය. ටෙන්ඩර් කළ හැකි මුදල රුපියල් මිලියන 5 ඉක්මවන සෑම ලංසුවක් සඳහාම ලංසුකරු විසින් 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතින් 3 වන වගන්තිය ප්‍රකාරව පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන ලද වලංගු සහතිකය ඉදිරිපත් කළ යුතුය. මෙය කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා සුදුසු කමකි.	මෙම ලංසුව සඳහා ඉදිකිරීම් කාලය ලිත් දින 120 කි. ව්‍යාපෘති ස්ථානය මාතර දිස්ත්‍රික්කය, පුරාණවැල්ල ධීවර වරාය.	රු. 400,000.00 2027.02.22 දක්වා වලංගු විය යුතුය.	2026.10.14 දින පෙ.ව. 10.30 ට ස්ථානය : අධ්‍යක්ෂ මණ්ඩල ශාලාව ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක්හවුස් පටුමග, කොළඹ 15.
CFHC/PD/ WQW/MIR/ 2026/107	මිරිස්ස ධීවර වරායෙහි නව වේදිකා බැම්ම (New quay wall) ඉදිකිරීම	ගැබියන් සහ RC සමග නව වේදිකා බැම්ම (quay wall) ඉදිකිරීම මෙම කාර්යයට අයත් වේ.	VAT සහ අනපේක්ෂිත වියදම් රහිතව ආසන්න වශයෙන් ඉංජිනේරු ඇස්තමේන්තු රුපියල් මිලියන 35.7 කි.	පසුගිය වසර පහ (2019, 2020, 2023, 2024, 2025) තුළ ඉටු කරන ලද ඉදිකිරීම් වැඩවල සාමාන්‍ය වාර්ෂික ධාරිතාව අවම වශයෙන් රුපියල් මිලියන 35.7 ක් විය යුතුය. පසුගිය වසර දහය තුළ මෙම කාර්යයට සමාන ස්වභාවයෙන් (ගේබියන් බිත්ති ඉදිකිරීම - Gabion wall construction) සහ සංකීර්ණත්වයෙන් යුත් ඉදිකිරීම් කොන්ත්‍රාත් අවම වහයෙන් එකක් ප්‍රධාන කොන්ත්‍රාත්කරු ලෙස ඉදිකිරීමේ පළපුරුද්ද (මේ සඳහා ඉදිරිපත් කරනු ලබන වැඩ කොන්ත්‍රාත්තුව අවම වශයෙන් 70% ක් සම්පූර්ණ කොට තිබිය යුතුය) රුපියල් මිලියන 24.9 අතෙකුත් ඉදිකිරීම් කොන්ත්‍රාත් වගකීම් වලින් තොරව හා ව්‍යාපෘතිය සම්පූර්ණ වන දින තෙක් මෙම කොන්ත්‍රාත්තුව යටතේ ගෙවීමට සිදුවන ඕනෑම අත්තිකාරම් මුදලක් හැර තිබිය යුතු අවම ද්‍රවශීල වත්කම් සහ / හෝ ණය පහසුකම රුපියල් මිලියන 17.85 ට නොඅඩු විය යුතුය. ටෙන්ඩර් කළ හැකි මුදල රුපියල් මිලියන 5 ඉක්මවන සෑම ලංසුවක් සඳහාම ලංසුකරු විසින් 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන ලද වලංගු සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. මෙය කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා සුදුසුකමකි.	මෙම ලංසුව සඳහා ඉදිකිරීම් කාලය ලිත් දින 180 කි. ව්‍යාපෘති ස්ථානය මාතර දිස්ත්‍රික්කය, මිරිස්ස ධීවර වරාය.	රු. 450,000.00 2027.02.22 දක්වා වලංගු විය යුතුය.	2026.10.14 දින පෙ.ව. 11.00 ට ස්ථානය : අධ්‍යක්ෂ මණ්ඩල කාමරය, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක් හවුස් පටුමග, කොළඹ – 15.

04. තනි හෝ හවුල් ව්‍යාපාර වන උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු දුරකථන අංක 011-2527439 මගින්, කොළඹ 15, රොක් හවුස් පටුමග, අංක 15, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, සිවිල් ඉංජිනේරු අංශය, සිවිල් ඉංජිනේරු කළමනාකරු වෙතින් ලබාගත හැකි අතර, කොළඹ 15, රොක් හවුස් පටුමග, අංක 15, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, ප්‍රසම්පාදන අංශයේ කාර්යාලයේදී හෝ අදාළ ධීවර වරායන් හිදී ගාස්තු ගෙවීමකින් තොරව ප්‍රසම්පාදන ලිපි ලේඛන පරීක්ෂා කොට බැලිය හැකිය.

05. එක් එක් ප්‍රසම්පාදනය සඳහා රු. 10,000.00 ක නැවත නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව, කොළඹ 15, රොක් හවුස් පටුමග, අංක 15, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, ප්‍රසම්පාදන කළමනාකරු වෙත ව්‍යාපාරික ලිපි ශීර්ෂයක් මගින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් 2026.10.05 දින සිට 2026.10.26 දින දක්වා ඕනෑම වැඩ කරන දිනයක දී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළදී උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් සකසා ඇති සම්පූර්ණ ප්‍රසම්පාදන කට්ටලයක් මිලදී ගත හැකිය.

06. මුදු, තැබූ ලංසු මුල්පිටපත හා අනුපිටපත ලෙස, 2026.10.27 දින පෙ.ව. 11.00 ට හෝ ඊට පෙර "**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ප්‍රසම්පාදන අංශය, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක් හවුස් පටුමග, කොළඹ 15**" වෙත ගෙනැවිත් භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීමේ කාලය අවසන් වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් ලංසු විවෘත කරනු ලැබේ. (ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගිවන මෙන් ඉල්ලා සිටිනු ලැබේ.)

07 ලංසු 2027.01.25 දින දක්වා වලංගු විය යුතුය. (ලිත් දින දින 91 ක්)

08. සියලුම ලංසු සමග, 9 වන කොටසෙහි'සම්මත ආකෘති (ලංසු) හි ඇතුළත් කර ඇති ආකෘතියෙන් යුත්, "**සභාපති, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, නැ.පෙ. 1747 සහ රොක් හවුස් පටුමග, කොළඹ 15**" නමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවක් වෙතින් ලබාගන්නා ලද ලංසු විවෘත කරනු ලබන දින සිට දින 119 ක් දක්වා (2027.02.22) වලංගු ලංසු සුරක්ෂණයක් (බැංකු ඇපකරයක් හෝ නැවත ගෙවනු ලබන මුදල් තැනක්පතුවක්) අමුණා එවිය යුතුය. (මුදල් තැන්පතු පත්‍රිකාවේ මුල් පිටපත ලංසු සමග ඇමිණිය යුතුය) මුදල් තැන්පතු ද භාර ගනු ලැබේ.

09. සියලුම ලංසුකරුවන් CIDA/SBD/01 දෙවන මුද්‍රණය, 2027 ජනවාරි (පෙර ICTAD/SBD/01) ලේඛනය සැලිකිල්ලෙන් කියවන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,
අංක 15, රොක් හවුස් පටුමග, කොළඹ 15.